
# ස්නාවක ජොහාන් තුමා




පරිවර්තනය - www.subaasna.com

දවසක් දේව මාලිගාවේ සෙකරියා කියන වයසක පුජක තුමා
සුවද දුම් පත්තු කර කර හිටියා. එළියේ හිටිය අය යාච්ඤා කර කර හිටියා.
එකපාරට ඔහු තිගැස්සුනා.



2.1

දෙවියන් වහන්සේගේ දේව දුතයෙක් ඔහු සිටිය තැනට ආවා. ඔහු මෙසේ කිව්වා.
බය වෙන්න එපා දෙවියන් වහන්සේයි මාව ඔබ වෙත එව්වේ.
ඔබේ භාර්යාවට පුතෙක් ලැබේවි. ඔහුට ජොහාන් කියල නම තියන්න.
ඔහු ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් පිරුන කෙනෙක්.
ඔහු දෙවිදුන් වෙතට ගොඩක් මිනිසුන් ගෙන එන කෙනෙක් වෙනවා” කියල



2.2


සෙකරියා තුමාගේ භාර්යාව වයසක කෙනෙක් හින්ද ඔහු
මේ දේ විශ්වාස කලේ නැහැ. ඒ හින්දම ඔහුට ජොහාන්
ඉපදෙනකල් ඔහුට කථා කරන්න බැරි උනා.
2.3


ඔහු ගෙදරට ගියාට පස්සේ කොලයක් අරගෙන
දේව දුතයා ඔහුට කිව්ව දේ ලියලා භාර්යාවට පෙන්නුවා.
ඇය පුදුමයට පත් වුනා. ඔවුන් එක්ව යාච්ඥා කළා.
2.4



ඇගේ නම එලිසබෙත්,
ඇය මේ දේ විශ්වාස කළා.
දෙවිදුන්ට ප්‍රසංශා කළා. එක දිනෙක ඇගේ
ඥාතියෙකු වූ මරිය තුමිය,
ජේසුගේ අම්මා ඇය බලන්න ආවා.
ඒ වෙනකොට මරිය තුමියත් ජේසුව කුසේ
දරාගෙන හිටියේ මේ ලෝකයට බිහි කරන්න.

2.5




මරියතුමිය ආවා විතරයි එලිසබෙත් තුමියගේ
කුසේ ඉන්න දරුවා සතුටින් දගලන්නට උනා.
ඇය දැනගෙන හිටියා
මරිය තුමිය දෙවියන් වහන්සේගේ පුත්‍රයා
ජේසු තුමාගේ මව වෙන්න යනවා කියල.
එලිසබෙත් තුමිය ශුද්ධාත්මයාණන් වහන්සේගෙන්
පිරිලා මරිය තුමිය සමග දෙවියන් වහන්සේට
ප්‍රසංශා කළා

2.6


එළිසබෙත් තුමියගේ දරුවා ඉපදුනා.
අනිත් පුජකවරු කිව්වා ඔහුටත් සෙකරියා කියා
නම තියන්න කියල.
ඒත් සෙකරියා තුමාට දෙවිඳුන්ගේ පණිවුඩය
මතක් උනා. එහෙම මතක් වෙලා ඔහු කොලයක්
අරගෙන පුතාගේ නම ජොහාන් කියල ලිව්වා.
මොකද ඔහුට තවමත් කථා කරන්න බැරි හින්ද.
ඒ එක්කම යලිත් ඔහුට
කථා කරන්න පුළුවන් උනා.
2.7


ජොහාන් තුමා ලොකු උනාට පස්සේ ඔහු බය
නැතුව දේශනා කරන්න පටන් ගත්තා
දෙවියන් වහන්සේගේ පුත්‍රයා
අප අතරට ළඟදීම එනවා කියල.
පසුතැවිලි වෙන්න, පාපයෙන් ඈත් වෙන්න කියල
ඔහු දේශනා කළා. ජුදෙව් නායකවරු ඔහුට
විරෝධ උනා. මොකද ඔවුන්ට ඔහුන්ගේ වැරදි
ගැන අහන්න ඕනි උනේ නැහැ.
2.8


ජොහාන් තුමාව ස්නාවක ජොහාන් තුමා ලෙස හදුන්වන්න පටන් ගත්තා.
ඔහු මිනිසුන්ට පසුතැවිලි වෙන්න ආරාධනා කළා, බෞතීස්ම ස්නාපනය
ඔවුන්ට ලබා දුන්නා. දිනක් ජේසු තුමා පැමිණ තමන්වත්
බෞතීස්ම ස්නාපනය කරන්න කිව්වා. එතුමා එය ප්‍රතික්ෂේප කළා.
නමුත් ජේසුගේ ඉල්ලීම මත ජේසුව බෞතීස්ම ස්නාපනය කළා.
2.9


ජේසුව බෞතීස්ම ස්නාපනය කල විගස
ශුද්ධාත්මයාණන් වහන්සේ පරවියෙකු
විලාසයෙන් පැමිණියා. ජොහාන් තුමා
දැනගෙන හිටියා ජේසු කියන්නේ දෙවියන්
වහන්සේගේ පුත්‍රයා කියල.
ඒ සමගම මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය,
මොහු කෙරෙහි මම ඉතා ප්‍රසන්න වී සිටිමි යි
හඬක් පැමිණියා.
2.10



ජොහාන් තුමා ගොඩක් මිනිසුන්ව
දෙවියන් වහන්සේ වෙතට ගෙන එන්න
කටයුතු කළා. නමුත් හෙරෝද් කියන නපුරු
රජ ඔහුව හිරබාරයට ගත්තා.
ඒ තමන්ගේ සහෝදරයාගේ බිරිඳ හෙරෝදියස්
තබාගෙන සිටීම වරදක් කියා ජොහාන් තුමා
පැවසූ නිසා. ජොහාන් තුමා කියන්නේ
දෙවියන් වහන්සේගේ සේවකයෙක් කියල
හෙරෝද් රජ්ජුරුවෝ දැනගෙන හිටියත්
තමන්ගේ පාප නැවැත්තුවේ නැහැ

2.11

දිනක් හෙරෝද් රජ මාලිගයේ ලොකු උත්සවයක් තිබුනා.
හෙරෝදියස්ගේ දුව එහිදී නැටුමක් ඉදිරිපත් කළා.
ඒක දැකපු රජ්ජුරුවෝ සතුටින් කිව්වා දුවට ඕනිම දෙයක් ඉල්ලන්න,
රටෙන් භාගයක් උනත්, මම ඒක දෙන්නම් කියල.



2.12


හෙරෝදියස්ගේ දුව අම්මගෙන් ඇහුව
මොනවද මම ඉල්ලන්න ඕනි කියල.
ඒ පාපී කාන්තාව ගොඩක් තරහින්
හිටියේ ස්නාවක ජොහාන් තුමා එක්ක.
ඇය කිව්වා ස්නාවක ජොහාන් තුමාගේ
හිස තැටියක දාල ගෙනත් දෙන්න
කියල ඉල්ලන්න කියල
2.13
මේ දේ හෙරෝදියස්ගේ දුව හෙරෝද් ගෙන් ඉල්ලුවා.
හෙරෝද් අකමැත්තෙන් උනත් තමන්ගේ
පොරොන්දුව හින්දා සොල්දාදුවන්ට අණ කළා
ස්නාවක ජොහාන් තුමාගේ හිස
තැටියක තියල ගෙනත් දෙන්න කියල.
2.14

අවසානයේ ස්නාවක ජොහාන් තුමාගේ මිතුරන්
එතුමාගේ ශරීරය ගෙන ගොස් වලලුවා.
නමුත් උන්වහන්ස්ගේ සේවය අමරණීයයි.
දෙවියන් වහන්සේගේ සැබෑ සේවකයෙක් ලෙස
ප්‍රාණ පරිත්‍යාගීවරයෙක් උනා.



2.15